කැළණිය විශ්ව විද්‍යාලය - ශ්‍රී ලංකාව

දුරස්ථ සහ අඛණ්ඩ අධ්‍යයන කේන්ද්‍රය

වාණිජ හා කළමණාකරන අධ්‍යයන පීඨය

වාණිජ විද්‍යාවේදි (විශේෂ) උපාධි දෙවන වසර පරීක්ෂණය (බාහිර)- 2012

2015 පෙබරවාරි

**BCOME 2073** - සංවර්ධන ආර්ථීක විද්‍යාව

ප්‍රශ්න සංඛ්‍යාව - 06 | කාලය - පැය තුනයි (03)

ඕනෑම ප්‍රශ්න පහකට (05) පමණක් පිළිතුරු සපයන්න.

---

01. අ. වර්තමානයේ ලෝක ජනගහනය බිලියන 7 ක් පමණ වන අතර එය 2050 දී බිලියන 9 ක් පමණ වේ යැයි අපේක්ෂා කරයි. ජනගහනය වර්ධනය වීම සැබෑවටම ප්‍රශ්නයක්ද ? සාකච්ඡා කරන්න.

(ලකුණු 10)

ආ. සංවර්ධනය වෙමින් පවතින රට වලට ජනගහන වර්ධන ගැටළුව සම්බන්ධයෙන් ගත හැකි ප්‍රතිපත්තියම ක්‍රියාමාර්ග මොනවාද?

(ලකුණු 10)
(මුළු ලකුණු 20)

02. අ. රටක ආදායම් අසමානතාව අවබෝධ කර ගැනීමට ඔබට භාවිතා කළ හැකි මිනුම් කෙටියෙන් පැහැදිලි කරන්න.

(ලකුණු 06)

ආ. ශ්‍රී ලංකාවේ දුගීබව සහ ආදායම් අසමානතාවය තුරන් කිරීමට ගත හැකි විකල්ප ප්‍රතිපත්ති යෝජනා කරන්න.

(ලකුණු 14)
(මුළු ලකුණු 20)

03. අ. අධ්‍යාපනය හා සෞඛ්‍ය සඳහා රජය විසින් කරන ආයෝජනය ඉහළ නැංවීම තුලින් ශ්‍රී ලංකාවට අත්පත් කර ගත හැකි ප්‍රතිලාභ මොනවාද ? සාකච්ඡා කරන්න.

(ලකුණු 20)

04. අ. ආතර් ලුවිස් ගේ ශ්‍රම අතිරික්ත න්‍යාය පැහැදිලි කරන්න.

(ලකුණු 10)

ආ. රටක සංවර්ධනය මැනීම සඳහා මානව සංවර්ධන දර්ශකය අනෙකුත් දර්ශක සමග සසඳන කළ කොතෙක් දුරට ප්‍රමාණවත් වේද ?

(ලකුණු 10)

(මුළු ලකුණු 20)

05. ශ්‍රී ලංකාවේ ආර්ථික ඉලක්ක ළඟා කර ගැනීම සඳහා සෘජු විදේශ ආයෝජන විශාල වශයෙන් යොදා ගනී. සෘජු විදේශ ආයෝජන වල පවතින හිත කර හා අහිතකර ප්‍රතිවිපාක මොනවාද ? සාකච්ඡා කරන්න.

(මුළු ලකුණු 20)

06. කෙටි සටහන් ලියන්න.

අ. ස්ත්‍රී පුරුෂ අධ්‍යාපනික පරතරය.

ආ. ගෝලීයකරණය

ඇ. විරැකියාව

ඉ. බුද්ධි ගලනය

(මුළු ලකුණු 20)